සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - නැගෙනහිර පළාත
**Provincial Department of Education – Eastern Province**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) ආදර්ශ ඇගයීම - 2024
**General Certificate of Education(Ordinary Level)Model Assessment - 2024**

| | | | |
|---|---|---|---|
| ගෘහ ආර්ථික විද්‍යාව - I, II<br>Home Economics - I, II | 85 | S | I, II |

කාලය පැය තුනයි
**Three Hours**

- අමතර කියවීම් කාලය - මිනිත්තු 10
- අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදා ගන්න.

| | | | |
|---|---|---|---|
| ගෘහ ආර්ථික විද්‍යාව - I<br>Home Economics - I | 85 | S | I |

සැලකිය යුතුයි.
- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති ( I ), ( II ), ( III ) හා ( IV ) යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.
- ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ ( X ) ලකුණ යොදන්න.
- එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා ඒවා ද පිළිපදින්න

01. කිරි සහ කිරි ආහාරවල අඩංගු කාබෝහයිඩ්‍රේටයක් වනුයේ,

I. ගැලැක්ටෝස් ය. II. සෙලියුලෝස් ය. III. ග්ලූකෝස් ය. IV. ලැක්ටෝස් ය.

02. ස්නායු තන්තු වටා ඇති මයලින් කොපුව සෑදීමට අවශ්‍ය විටමිනය වන්නේ,

I. විටමින් C ය. II. විටමින් $B_3$ ය. III. විටමින් $B_1$ ය. IV. විටමින් K ය.

03. ශරීරය තුළ යකඩ අවශෝෂණයට අවශ්‍ය සංයෝග දෙකකි.

I. මැලික් අම්ලය සහ ලයිසීන් ය.

II. ටැනින් සහ ෆයිටික් අම්ලය යි.

III. මැලික් අම්ලය සහ ෆෝලික් අම්ලය යි.

IV. ෆයිටික් අම්ලය සහ ලයිසීන් ය.

04. මහා ඛනිජයක් වනුයේ මින් කුමක්ද?

I. ෆ්ලෝරයිඩ් ය. II. මැග්නීසියම් ය. III. මැන්ගනීස් ය. IV. යකඩ ය.

05. සත්ත්ව ආහාරවල විටමින් ඒ අඩංගු වනුයේ,

I. බීටා කැරොටින් ලෙසය. II. ඔමේගා 3 ලෙසය. III. රෙටිනෝල් ලෙසය. IV. මෙතියොනීන් ලෙසය.

06. මේද ජීර්ණය ආරම්භ වනුයේ,

I. ක්ෂුද්‍රාන්තයේදී ය. II. මුඛයේදී ය. III. ආමාශයේදී ය. IV. ග්‍රහණියේදී ය.

07. සිසුවියක විසින් පොතක මෙසේ සටහන් කළේය.

- අත්‍යවශ්‍ය ඇමයිනෝ අම්ල අඩංගුය.
- උසස් ජෛව අගයකින් සමන්විතය.
- තාපයට ලක්කිරීමේ දී කැටි ගැසේ.
- විටමින් හා ඛනිජවලින් පෝෂිතය.

ඉහත කරුණුවලට අනුව මෙහි සඳහන් ආහාරය වනුයේ,

I. බටර් ය. II. දඹල ය. III. සෝයාමීට් ය. IV. බිත්තර ය.

08. ශක්තිය කිලෝ කැලරි නමයක් (9 ක්) ලැබෙන ආහාර ද්‍රව්‍ය මින් කුමක්ද?

I. මඤ්ඤොක්කා II. කිරි අල III. පොල් තෙල් IV. සූකිරි

09. නිර්දේශිත පෝෂණ අවශ්‍යතා සටහනෙහි, අවශ්‍යතාව මිලි ග්‍රෑම්වලින් දක්වා ඇති පෝෂකය වනුයේ,

I. මේද II. කැරොටින් III. විටමින් $B_1$ IV. ප්‍රෝටීන

10. අධිබර තත්වය පෙන්නුම් කරන ශරීර ස්කන්ධ දර්ශකය වනුයේ,

I. 18.5 ය II. 25 ය III. 26.5 ය IV. 34 ය

11. මුත්‍ර සමඟ ශරීරයෙන් බැහැර කරන විටමිනයකි.

I. විටමින් C II. විටමින් K III. විටමින් E IV. විටමින් A

12. ජෙලටිනීකරණය සිදුවන අවස්ථාව පෙන්නුම් කරන වරනය කුමක්ද?

I. සුප් එකක් සෑදීමේ දීය. II. මඤ්ඤොක්කා තැම්බීමේ දීය.

III. පාන් ටෝස්ට් කිරීමේ දීය. IV. මාළු මිරිසට පිසීමේ දීය.

13. සිසුවියක් පහත සඳහන් රෝග ලක්ෂණ පාසලේ දී ප්‍රකාශ කලේය. මින් නීරක්තියේ රෝග ලක්ෂණ මොනවාද?

A: සිරුරේ ප්‍රතිශක්තිය අඩුවීම.

B: හෘද ස්පන්දනය වේගවත්වීම

C: සුදුමැලි වීම

D: මුහුණ, අත්, පා ඉදිමී තිබීම

E: සුළු කාර්යයක් කිරීමේ දී පවා අධික වෙහෙසට පත්වීම.

I. A, C හා E ය. II. B, C හා E ය. III. A, C හා D ය. IV. B, C හා D ය.

14. කිරණවලින් පිටවන අධි ශක්තිය නිසා ක්ෂුද්‍ර ජීවීන් විනාශ වන්නේ කිනම් පරිරක්ෂණ උපක්‍රමය හේතුවෙන්ද?

I. ප්‍රවිකිරණය II. වැඩි උෂ්ණත්වය යෙදීම III. විජලනය IV. අඩු උෂ්ණත්වය යෙදීම

15. පිටි මෝලියක් ඇසුරෙන් සකස් නොවන ආහාරයකි.

I. ඉඳි ආප්ප II. රොටී III. කොකිස් IV. පිටටු

16. ආහාර සැකසීමේ ක්‍රියාවලියේ දී අනුගමනය කළ යුතු නිවැරදි අනුපිළිවෙල වන්නේ,

I. සේදීම, කුළුබඩු යෙදීම, කැපීම, පිරිසිදු කිරීම හා පිසීමයි.

II. පිරිසිදු කිරීම, සේදීම, කැපීම, කුළුබඩු යෙදීම හා පිසීමයි.

III. පිරිසිදු කිරීම, කැපීම, සේදීම, කුළුබඩු යෙදීම හා පිසීමයි.

IV. සේදීම, කැපීම, පිරිසිදු කිරීම, කුළුබඩු යෙදීම හා පිසීමයි.

17. රොටී සැකසීමේ දී ප්‍රධාන වශයෙන් තාපය සංක්‍රමණය වන්නේ,

I. විකිරණය නි. II. සංවහනය සහ සන්නයනය නි. III. සන්නයනය නි. IV. සංවහනය නි

18. ළමා සංවර්ධනය හා සම්බන්ධ නිවැරදි ප්‍රකාශය තෝරන්න.

I. ස්ත්‍රී ප්‍රජනක පද්ධතිය ඩිම්බකෝෂය, පැලෝපීය නාල, ගර්භාෂය සහ වෘෂණ මගින් සමන්විතය.

II. සතියට වරක් ඩිම්බ මෝචනය සිදු වේ.

III. ළදරුවෙකුගේ බර අවුරුද්දේ දී උපත් බර මෙන් තුන් ගුණයක් පමණ වේ.

IV. ගර්භණී මවක් මාතෘ සායනයට සහභාගීවීම අනිවාර්යය නොවේ.

19. ගර්භණී අවධියේ දී වෛද්‍ය උපදෙස් අවශ්‍ය නොවන අවස්ථාවකි.

I. ආහාර අරුචිය II. සමාජ රෝග III. ඇදුම IV. දියවැඩියාව

20. මාතෘ සායනයක දී ත්‍රිපෝෂ වලට අමතරව ලබා දෙන පෝෂකය කුමක්ද?

I. විටමින් B II. මැන්ගනීස් III. යකඩ IV. විටමින් A



AnyScanner

21. ළදරුවෙකුට මාස දොළහ අවසානයේ ලබා දෙනු ලබන එන්නත වනුයේ,

I. ත්‍රිත්ව එන්නත සිව්වන මාත්‍රාව

II. පංච සංයුජ පළමු මාත්‍රාව

III. MMR දෙවන මාත්‍රාව

IV. MMR පළමු මාත්‍රාව

22. වයස මාස 7-8 සම්පූර්ණ වූ ළදරුවෙකුගේ චාලක හැකියාවක් වන්නේ,

I. උදව් නැති ව තනි ව වාඩි වෙයි.

II. ගෙල ඔසවයි.

III. අත්ලෙන් අල්ලයි.

IV. උදව් නැති ව නැගිටියි.

23. ප්‍රතිජීවක ඖෂධ මගින් සුව කළ හැකි ලිංගික සම්ප්‍රේෂණ රෝගයකි.

I. ලිංගික ඉන්නන්

II. ගොනෝරියා

III. හර්පීස්

IV. ඒඩ්ස්

24. දරුවෙකුට ආහාර ගැනීමට පුරුදු කිරීමේ දී අවධානය යොමු නොකළ යුතු කරුණක් වන්නේ,

I. තනිව ආහාර ගැනීමට යොමු කිරීම.

II. ආහාර ගැනීමට පෙර දෑත් පිරිසිදු කිරීමට පුරුදු කිරීම.

III. කතන්දර කීම.

IV. දරුවා සඳහා වෙන් වූ පිඟන්, කෝප්ප භාවිතය.

25. ළදරුවෙකු ඝන ආහාරවලට පුරුදු කිරීමේ දී ඔබ විසින් ගතයුතු පියවරක් වන්නේ,

I. පළමුව මස් හා මාළු පමණක් ආහාරයට ලබා දීම.

II. ආසාත්මිකතා ඇති වේ දැයි අවධානයෙන් සිටීම.

III. ලුණු, සීනි, තෙල් අවශ්‍ය පරිදි ආහාරයට එක් කිරීම.

IV. උදේ සහ රාත්‍රියට පමණක් ආහාර වේල් ලබා දීම.

26. ගර්භණී මවකට ලබාදිය යුතු එන්නතකි.

I. රුබෙල්ලා

II. MMR

III. පෝලියෝ

IV. පිටගැස්ම

27. නවජ දරුවෙකු තුළ දැකිය නොහැකි ලක්ෂණය මින් කුමක්ද?

I. ශරීරය ඝන රෝම වලින් හා මේද පටක වලින් වර්ධනය වී ඇත.

II. හිසෙහි වට ප්‍රමාණය 34cm වේ.

III. නවජ දරුවෙකුගේ උපත් බර 2.5 – 3.5 Kg වේ.

IV. නවා වකුටු කර ගත් අත් පා වලින් සමන්විතය.



AnyScanner

28. ළමා ගවුමක් නිර්මාණය කිරීමේ දී සැලකිලිමත් නොවිය යුතු කරුණක් වන්නේ,

I. ලිහිල්ව මසා තිබීම.

II. උචිත පියවීමේ ක්‍රම යොදා තිබීම

III. ඇඟලෑමට හා ගැලවීමට පහසුවීම.

IV. විශාල මෝසතර සහිත සනකම් රෙදි භාවිතය

29. මේස දරණුවක් මැසීමේ දී එය ක්විල්ට් කිරීම සඳහා භාවිත කරනු ලබන මැස්ම කවරේද?

I. වාටි මැස්ම II. සැඟි වාටි මැස්ම III. සිහින් නූල් දුවවීම IV. පිස්මේන්තු මැස්ම

30. රෙයෝන්

I. ස්වභාවික ශාකමය කෙන්දකි. II. අර්ධ කෘත්‍රිම කෙන්දකි.

III. කෘත්‍රිම කෙන්දකි. IV. ස්වභාවික ඛනිජමය කෙන්දකි.

31. මින් නිවැරදි ප්‍රකාශය තෝරන්න.

I. කපු රෙද්දක් මතුපිට අත ගා බැලීමේ දී මෘදු බවක් හා උණුසුම් බවක් දැනේ.

II. ළදරු ඇඳුම වැඩි මූට්ටු ප්‍රමාණයකින් යුක්තය.

III. මූලික පතරොම භාවිතයෙන් වෙනත් පන්න ගොඩනැගිය නොහැක.

IV. එකම වයස් සීමාවක පසුවන පුද්ගල නියැදියක මිනුම්වල සාමාන්‍ය අගය සම්මත මිනුම නම් වේ.

32. ශිල්පීය මැහුම් ක්‍රම පමණක් ඇතුළත් වරනය තෝරන්න.

I. ප්‍රංශ මූට්ටුව, බඳන යෙදීම, අණ්ඩ දැමීම, පළල් ඔපනැලි

II. නූල් ඇදීම, සැඟි වාටි මැස්ම, පිස්මේන්තු මැස්ම, සන්නාලි වාටි මැස්ම

III. සිහින් නූල් දුවවීම, ප්‍රංශ ගැට මැස්ම, සැටින් මැස්ම, විසිතුරු රැළි

IV. සැටින් මැස්ම, බුලියන් මැස්ම, කතිර මැස්ම, නැටි මැස්ම

33. උපාංග නිර්මාණයේ දී අවශ්‍ය උපකරණයක් හා මෙවලමක් පිළිවෙලින්,

I. මහන යන්ත්‍රය හා ස්ත්‍රික්කය II. ස්ත්‍රික්කය හා බොත්තම්

III. මහන යන්ත්‍රය හා දිදාලය IV. රෙදි සහ රේන්ද

34. ළදරු ඇඳුමෙහි කර මැසීම සඳහා සුදුසු ක්‍රම දෙකකි.

I. බීක්කු මැසීම හා සිප්පි මැස්ම යෙදීම.

II. බීක්කු මැසීම හා රැළි පටියක් ඇල්ලීම.

III. රැළි පටියක් ඇල්ලීම හා රේන්දයක් ඇල්ලීම.

IV. ඉඳිකටු රේන්දය මැසීම හා රැළි පටියක් ඇල්ලීම.



AnyScanner

35. රෙදි පිරියම් කිරීම සඳහා සම්බන්ධ නොවන්නකි.

I. සේදීම II. කැඳ දැමීම III. මැදීම IV. එල්ලා තැබීම

36. උදාසීන වර්ණ දෙකකි.

I. නිල් සහ රතු II. අළු සහ දුඹුරු III. තැඹිලි සහ කොළ IV. නිල්කොළ සහ රතු තැඹිලි

37. ගෘහීය සම්පත් වර්ගීකරණයට අනුව මානව සම්පතක් හා භෞතික සම්පතක් වන්නේ,

I. දැනුම හා කුසලතා II. ආකල්ප හා ප්‍රජා පහසුකම් III. කාලය හා විදුලිය IV. කාලය හා දේපළ

38. අක්වක් රේඛා මගින් නිර්මාණයක පෙන්නුම් කරනුයේ,

I. ක්‍රියාශීලී බව II. සුන්දර බව III. ඍජු බව IV. ශාන්ත බව

39. මෝස්තර මූලධර්මයකි.

I. වයනය II. වර්ණය III. අවධාරණය IV. හැඩය

40. විස්තෘත පවුලක ජීවත්වීමේ වාසියක් වන්නේ,

I. මුදල් පාලනය පහසු වීම

II. ස්වාධීනත්වය ආරක්ෂා වීම

III. සුරක්ෂිතබව වැඩිය

IV. වැඩිහිටි පරම්පරාව හා බාල පරම්පරාව අතර අදහස් ගැටීම් ඇතිවීම.

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - නැගෙනහිර පළාත
**Provincial Department of Education – Eastern Province**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) ආදර්ශ ඇගයීම - 2024
**General Certificate of Education(Ordinary Level)Model Assessment - 2024**

| | | | |
|---|---|---|---|
| ගෘහ ආර්ථික විද්‍යාව - II<br>Home Economics - II | 85 | S | II |

සැලකිය යුතුයි

- පළවෙනි ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් තෝරා ගෙන ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.
- පළමු ප්‍රශ්නයට ලකුණු 20ක් ද තෝරාගන්නා අනෙක් ප්‍රශ්නවලට ලකුණු 10 බැගින්ද වේ.

01 පහත සඳහන් සිද්ධිය අධ්‍යයනය කර දී ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

නිශානි ජාතික පාසලක ගෘහවිද්‍යා ගුරුවරියකි. ඇයගේ සැමියා කෘෂිකර්ම අංශයේ උසස් රැකියාවක නියලේ. මෑතකාලීනව යුගදිවියට පත් නිශානි සයමස් ගැබිණියකි. නිශානිගේ නැන්දනිය ද ඔවුනගේ තනි නොතනියට සිටින අතර ඇය දක්ෂ මැහුම් ශිල්පිණියකි. නිවාඩු දිනයන්හි දී මොවුන් එක්ව ගෙවතු අලංකරණය, ගෙවතු වගාව හා පරිරක්ෂිත ආහාර නිෂ්පාදන ආදියේ නියලී අමතර ආදායමක් ලබයි.

I. මෙම පවුල අයත් පවුල් වර්ගය නම් කරන්න.
II. නිශානිගේ විශේෂ පෝෂණ අවශ්‍යතා හතරක් නම් කරන්න.
III. මෙම පවුල සඳහා දෛනික ආහාර වේල් සැලසුම් කිරීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු හතරක් ලියන්න.
IV. ආහාර පරිරක්ෂණය කිරීමේ වැදගත්කම කරුණු දෙකකින් පෙන්වන්න.
V. ළදරු ඇඳුම් නිර්මාණය සඳහා රෙදි තේරීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු දෙකක් ලියන්න.
VI. බිරිඳ නිශානිට මූලික අතහි පතොරොම් නිර්මාණය කිරීමට අවශ්‍ය මිණුම් දෙකක් ලියන්න.
VII. ගර්භණී අවධියේ පසුවන නිශානි මුහුණ දිය හැකි අවධානම් සාධක දෙකක් නම් කරන්න.
VIII. දරුවා ඉපදී මාස හතර අවසානයේ ලබා දෙන එන්නත කුමක්ද?
XI. නැන්දනියට ගෙවත්ත ක්‍රමානුකූලව හා අලංකාරව තබා ගැනීමට ගතහැකි ක්‍රියාමාර්ග දෙකක් ලියන්න.
X. මසා ඉතිරි වූ රෙදි කැබැලි භාවිතා කර නිර්මාණය කළ හැකි උපාංග හතරක් නම් කරන්න.

(ලකුණු 2×10 = 20)

02 I. ළමා ගවුම විසිතුරු කළ හැකි ආකාරය ක්‍රම හයකින් දක්වන්න. (ලකුණු 03)

II. රෙදි පිරියම් කිරීම උදාහරණ සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 03)

III. ළදරු ඇඳුමක තිබිය යුතු විශේෂ ලක්ෂණ කරුණු හතරකින් දක්වන්න. (ලකුණු 04)

03 I. ආහාර ගබඩා කර තැබීමේ දී ඒවායේ ගුණාත්මක බව කෙරෙහි බලපාන සාධක තුනක් නම් කර ඉන් එකක් පැහැදිලි කරන්න. (කරුණු තුනට ලකුණු 1 ½ , පැහැදිලි කිරීමට ලකුණු 1 ½)

II. 70 වැනි වියෙහි පසුවන ඔබගේ මිත්තණියට සුදුසු රාත්‍රී ආහාර වේලක් සැලසුම් කරන්න. ඔබ සැලසුම් කළ බොජුන්පතෙහි ආහාර තෝරා ගැනීමට හේතු දක්වන්න. (ලකුණු 03)

III. මේදවල කෘත්‍ය හතරක් ලියන්න. (ලකුණු 04)

04 I. ඇසුරුම් හා ලේබල්වල අඩුපාඩු හේතුවෙන් ආහාරවල ගුණාත්මක බව රැක ගැනීමට බලපාන දුෂ්කරතා තුනක් සඳහන් කරන්න. (ලකුණු 03)

II. විශේෂ අවස්ථා සඳහා ආහාර පිළිගැන්වීම පිළිබඳ හැදෑරීම තුළින් පාසල් සිසුවියක වන ඔබට අත්වන වාසි තුනක් ලියන්න. (ලකුණු 03)

III. අඹ වටිනි සෑදීමේ දී යොදාගන්නා පරිරක්ෂක කාරක නම් කර එය සාදන අයුරු ගැලීම් සටහනකින් පෙන්වන්න. (ලකුණු 04)

05 I. නිවසක් ගොඩනැඟීම සඳහා භූමියක් තෝරා ගැනීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු තුනක් නම් කරන්න. (ලකුණු 03)

II. ශ්‍රම විභජන සැලැස්මක් සකස් කිරීමෙන් ඔබට ලැබෙන වාසි තුනක් සඳහන් කරන්න. (ලකුණු 03)

III. ඔබගේ නිවසේ පරිභෝජනය කරනු ලබන විදුලිය පිරිමසා ගන්නේ කෙසේ දැයි කරුණු හතරකින් දක්වන්න. (ලකුණු 04)

06 I. ළදරුවකුගේ මානසික හා භාෂා වර්ධනය නිරීක්ෂණය කළ හැකි ප්‍රතිචාර තුනක් නම් කරන්න. (ලකුණු 03)

II. ස්ත්‍රී ප්‍රජනන පද්ධතියට අයත් අවයව 4ක් නම් කර ඉන් දෙකක කාර්යභාරය ලියන්න. (නම් කිරීමට ලකුණු 02යි , කාර්යභාරයට ලකුණු 01යි)

III. ගැබිණි සමයේ දී ගර්භණී මවක් විසින් අනුගමනය කළ යුතු යහපත් ආහාර පුරුදු හතරක් ලියන්න. (ලකුණු 04)

07 I. ලිංගික සම්ප්‍රේෂණ අසාදනවල ලක්ෂණ තුනක් ලියන්න. (ලකුණු 03)

II. නව යොවුන් වියේ පසුවන ගැහැණු දරුවෙකු පෙන්වන ද්විතියික ලිංගික ලක්ෂණ තුනක් සඳහන් කරන්න. (ලකුණු 03)

III. පහත සඳහන් දෑ පිළිබඳ කෙටි සටහන් ලියන්න.

(a) ඩිම්බමෝචනය
(b) කළල අවධිය (ලකුණු 04)



Downloaded from Past Papers Wiki - Most Extensive Wikipedia of Past Papers!
AnyScanner

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - නැගෙනහිර පළාත

# Provincial Department of Education – Eastern Province

ගෘහ ආර්ථික විද්‍යාව - I

**Home Economics - I**

ආදර්ශ පිළිතුරු

| ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය |
|---|---|---|---|---|---|---|---|
| 01 | 4 | 11 | 1 | 21 | 1 | 31 | 4 |
| 02 | 3 | 12 | 2 | 22 | 1 | 32 | 1 |
| 03 | 1 | 13 | 2 | 23 | 2 | 33 | 3 |
| 04 | 2 | 14 | 1 | 24 | 3 | 34 | 1 |
| 05 | 3 | 15 | 4 | 25 | 2 | 35 | 2 |
| 06 | 4 | 16 | 2 | 26 | 4 | 36 | 2 |
| 07 | 4 | 17 | 3 | 27 | 1 | 37 | 2 |
| 08 | 3 | 18 | 3 | 28 | 4 | 38 | 1 |
| 09 | 3 | 19 | 1 | 29 | 3 | 39 | 3 |
| 10 | 4 | 20 | 3 | 30 | 2 | 40 | 3 |

(9) WWW.PastPapers.WiKi (9)



Downloaded from Past Papers Wiki - Most Extensive Wikipedia of Past Papers!